**සුරාබදු දෙපාතර්මේන්තුවේ සුරාබදු තැගි අරමුදල - 2023**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු තැගි අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1990 අංක 37 දරන සුරාබදු සංශෝධන පනතින් සංශෝධිත 1912 අංක 08 දරන සුරාබදු ආඥාපනතේ 58 “ඒ” වගන්තිය හා සුරාබදු ආඥාපනතේ 32(2) (කිව්) වගන්තිය යටතේ වූ අංක 818 සුරාබදු නිවේදනය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු. 3,771,335 ක් වූ දේපළ පිරියත උපකරණ මිලදී ගැනීම් සහ ක්ෂය සංචිත අරමුදලට මාරුකල රු.11,707,328 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවත් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 07 අනුව ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 47,134,000 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වෙන වෙනම හඳුනාගෙන නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි විධිමත් පරිදි පවරා ගැනීමෙන් අනතුරුව තක්සේරු කර, මූල්‍ය ප්‍රකාශනවල වෙනම පෙන්වීමට කටයුතු කෙරේ. | එම |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 07 අනුව ගොඩනැගිල්ලේ අගය හඳුනාගෙන ක්ෂය ගැලපීම සඳහා එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය මුළුල්ලේ ක්‍රමානුකූල පදනමක් මත බෙදාහැරීම කලයුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ක්ෂය කර නොතිබුණි. | තක්සේරු කිරීමෙන් පසු ගොඩනැගිල්ලේ පිරිවැය වටිනාකමට ඉදිරියේ දී ක්ෂය ගණනය කිරීම කරන බව | එම |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක - 07 අනුව දේපළ පිරියත හා උපකරණ උපලේඛනය තුල වත්කම් වල දළ ධාරණ අගය ,සමුච්චිත ක්ෂය, ශුද්ධ ධාරණ අගය හෙළිදරව් කල යුතු වුවද ගොඩනැගිලි , ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ ඇතුළු වත්කම් කාණ්ඩ අයිතම 08 ක එකතුව වූ රු.101,798,966 ක ශුද්ධ ධාරණ අගය පමණක් හෙළිදරව් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම දේපළ පිරියත හා උපකරණ වල දළ ධාරණ අගය රු. 190,995,393 ක් විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | එම |

### 1.5.2 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04ක සුරාබදු තැගි අරමුදලේ ශුද්ධ වත්කම් සැසඳීමේ දී 2019 සිට 2021 වර්ෂය දක්වා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් නිරීක්ෂණය වූ අතර ඒ හේතුවෙන් එම වර්ෂ වල ශුද්ධ වත්කම් ද ක්‍රමයෙන් සැලකිය යුතු පිරිහීමක් නිරීක්ෂණය වුවද ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂ වලදී ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයේ දි එම වර්ධන ප්‍රතිශතය සියයට 19 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී සියයට 12 ක් වී තිබුණි. | නිරීක්ෂණ හා එකඟ වන බව | අරමුදලේ ආදායම් තරකර ගැනීමට කටයුතු කරමින් මෙහෙයුම් අතිරික්තය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක භාණ්ඩාගාරයේ පැවති අරමුදලේ තැම්පත් ගිණුමේ ශේෂ සැසඳීමේ දී 2019 හා 2021 වර්ෂ වල පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂ වලදී සැලකිය යුතු වර්ධනයක් සිදුවී තිබුණි. ඉකුත් වර්ෂයේ එම වර්ධන ප්‍රතිශතය සියයට 34 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දී එය සියයට 19 ක් වී තිබුණි. | නිරීක්ෂණ හා එකඟ වන බව | අංක 818 සුරාබදු නිවේදනය පරිදි අරමුදලේ තැන්පත් ගිණුමේ පවතින ශේෂය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 (අ) I හා II ඡේද | ලැබෙන සිගරට් දඩ මුදලින් සියයට 25 ක කොටසකින් දුම්කොළ තැගි අරමුදලක් පිහිටුවීමට කටයුතු සිදු කළ යුතු වුවත් අරමුදලේ ආරම්භක දින සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම එවැනි අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. මේ දක්වාම වාර්ෂිකව වෙන්කල මුදල් ආයෝජනයකින් තොරව දුම්කොළ තැගි අරමුදලට ගෙවිය යුතු රු.24,363,751 ක දිගුකාලීන බැරකමක් ලෙස පැවතුණි. | 1999 අංක 08 දරණ දුම්කොළ බදු පනතට අදාලව නියෝගවලට අවශ්‍ය නව සංශෝධන ඇතුළත් කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර, අදාළ සංශෝධන සකස් කිරීම ආරම්භ කර ඇත. ඒ යටතේ දුම්කොළ බදු පනතට අදාළ අරමුදල සම්බන්ධව වන යෝජනා ක්‍රමයද කෙටුම්පත් කිරීමට කටයුතු කරන අතර එම කටයුතු අවසන් කර දුම්කොළ අරමුදල පිහිටු වීමට කටයුතු කරන බව | දුම්කොළ තැගි අරමුදල පිහිටුවීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 36,968,594 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 48,444,530ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 11,475,936 ක් හෙවත් සියයට 23 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමථ ගාස්තු හා සිගරට් දඩ ආදායම රු. 13,744,078 කින් හෙවත් සියයට 8 කින් වැඩි වුවද තැගි මුදල් ගෙවීම්, ක්ෂයවීම් ඇතුළු වියදම් රු. 25,220,014 ක් හෙවත් සියයට 22 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.	මෙහෙයුම් සමාලෝචනය**

**3.1	කළමනාකරණ ක්‍රියාකාරකම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ අරමුදලේ සත්‍ය ආදායම රු.173,290,859 ක් වු අතර ඉන් සියයට 97 ක් සමථ ගාස්තු ආදායම් නියෝජනය විය. සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සමථ ගාස්තු ආදායම රු.150,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ අයවැය ලේඛනයේ ඇස්තමේන්තුගත රු.175,000,000 ක සමථ ගාස්තු ආදායම් සමඟ සැසදීමේ දි රු. 25,000,000 ක් හෙවත් සියයට 17 ප්‍රතිශතයකින් අඩුවෙන් ඇස්තමේන්තු කර තිබු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ රු.162,558,319 ක සමථ ගාස්තු ආදායමක් උපයා තිබුණි. | 2022 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම ඇස්තමේන්තු කළ පරිදිම නොලැබීම හේතුවෙන් 2023 වර්ෂයේ දී 2022 වසරට සාපේක්ෂව රුපියල් මිලියන 25ක් අඩුවෙන් ඇස්තමේන්තු කර ඇත. | ආදායම් නිවැරදිව පුරෝකථනය කර ඇස්තමේන්තු පිළියෙල කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල ඍජු ග්‍රහනයන් සිදුකල නිළධාරීන් සඳහා රු.23,285,638 ක් සහ සමස්ථ කාර්ය මණ්ඩලයට තෑගි දීමනා සඳහා රු.66,180,256 ක් අරමුදලින් ගෙවා තිබුණි. ග්‍රහන සඳහා ඍජුව සහභාගි වන නිළධාරීන් සඳහා තෑගි මුදල් ගෙවීම් නියෝජනය සියයට 26 ක අඩු අගයක් හා සමස්ථ කාර්ය මණ්ඩලයට තෑගි දීමනා ගෙවීම් සියයට 74 ක් විය. | 2023 වර්ෂයට පෙර වර්ෂවල දී ද දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ට සුරාබදු තෑගි අරමුදලේ මුදල් භාවිතා කර මූලික වැටුපෙන් 75% ක් සහ ඊට අඩු ප්‍රතිශතයන්ගෙන් දිරි දීමනා ගෙවීම් කර ඇති අතර අරමුදලේ මුදල් ශේෂය හීන වීම මත 2023 වර්ෂයේ දී ගෙවීම් කරනු ලැබුවේ මසකට මූලික වැටුපෙන් 12%ක ප්‍රතිශතයක් පමණි. | ප්‍රතිලාභ ගෙවීමේ දි අංක 818 සුරාබදු නිවේදනයේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

**3.2	කායර්සාධනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සුරාබදු දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්මික අපරාධ ග්‍රහනයන් 4,000 ක් සිදු කිරීමට සැලසුම් කර ග්‍රහන 5,499 ක් සිදුකර තිබුණි.ඉන් සුරාබදු ස්ථාන 10 ක ඉලක්ක සැපිරීමේ ප්‍රගතිය අඩු අගයක වු අතර සුරාබදු ස්ථාන 10 ක වාර්ෂික ඉලක්ක ඉක්මවා තිබුණ ද ලබා දී තිබුණු ග්‍රහන ඉලක්ක පහල අගයක විය. තවද සමාලෝචිත වර්ෂයේ තෑගි මුදල් ගෙවීම් | පවතින නිළධාරීන්ගේ හිගය පරීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ඇති වූ සීමාකාරී, තත්ත්වය ග්‍රහන ඉලක්ක සංශෝධනය කිරීමට සිදුකරන ලද නියෝජනයන් අනුව ඉලක්ක කල ප්‍රමාණයට වඩා ග්‍රහන අඩු වී ඇත.සාමාන්‍ය කොන්දේසි කඩ කිරීම් බහුලව සිදුවන අතර | වැටලීම් වල ගුණාත්මක ප්‍රගතියක් ලගා කර ගැනීම කෙරෙහි අවධානය යොමුකල යුතුය. |

| | | |
|---|---|---|
| සඳහා පදනම් වූ කාර්මික අපරාධ ග්‍රහණ ග්‍රහන 1,559 හි දඩ මුදල් විශ්ලේෂණය අනුව සියයට 65 ක ප්‍රතිශතයක් සාමාන්‍ය ගණයේ කොන්දේසි කඩකිරීම් වලට අදාළ වැටලීම් විය. | ප්‍රධාන ගණයේ කොන්දේසි කඩකිරීම් සිදුවන්නේ අල්ප වශයෙන් වේ. | |

## 4. අයවැය ලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යා සැසඳීමේදී ආදායම් විෂයන් 02 ක සියයට 8 සිට සියයට 114 දක්වා සහ වියදම් විෂයන් 09 ක සියයට 20 සිට සියයට 100 ක් දක්වා පරාසයක විචලතාවයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කලමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය. | මුල් කාර්තුවල වියදම් දැරීම සඳහා ඇස්තමේන්තු කළ පරිදිම මුදල් නොලැබීම , හා ගෙවීම් සඳහා වවුචර් ඉදිරිපත් නොවීම. අවසාන කාර්තුව තුළ අරමුදලට සැළකිය යුතු ආදායමක් හේතුවෙන් වියදම් දැරීමට නොහැකි වූ බව | ආදායම් ඇස්තමේන්තු තාත්විකව සැකසීම සහ අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය. |